03
පාඩම

# වඳිම් මහ සඟන මුනි නන්දන

"සුපටිපන්නො භගවතො සාවකසංඝො, උජුපටිපන්නො භගවතො සාවකසංඝො,
ඤායපටිපන්නො භගවතො සාවකසංඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො,
යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවකසංඝො,
ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො,
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති"

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආර්ය මාර්ග ප්‍රතිපදාවට මනාව පිළිපන් හෙයින් සුපටිපන්න ය. අවංක, ඍජු ප්‍රතිපදාවට පිළිපන් හෙයින් උජුපටිපන්න ය. නිවැරදි සම්‍යක් ප්‍රතිපදාවට පිළිපන් හෙයින් ඤායපටිපන්න ය. සසර දුකින් බැහැරලීමට සමත් ප්‍රතිපදාවට පිළිපන් හෙයින් සාමීචිපටිපන්න ය. සෝවාන් ආදී මාර්ගස්ථ ඵලස්ථ යනුවෙන් පුරිස යුගල වශයෙන් හතරක් වන, පුද්ගලයන් අට දෙනෙකු වන, අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නය දුර බැහැර සිට ගෙනවුත් පුදන සිවුපස පිළිගැනීමට සුදුසු වන හෙයින් ආහුනෙය්‍ය ය. බැහැරින් පැමිණෙන නෑ හිත මිතුරන් උදෙසා වෙන් කළ ආගන්තුක සංග්‍රහය පවා පිළිගැනීමට සුදුසුවන හෙයින් පාහුනෙය්‍ය ය. පරලොව සුවපතා දෙන දානය පිළිගැනීමට සුදුසුවන හෙයින් දක්ඛිණෙය්‍ය ය. දෑත් එක්තැන් කොට වැඳීමට ආචාර කිරීමට ගරු සැරු කිරීමට සුදුසුවන හෙයින් අඤ්ජලීකරණීය ය. ලෝකයාට දානාදී පින් බීජ වැපිරීමට සුදුසු උතුම් පින් කෙත වන බැවින් අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත ය.

### සුපටිපන්නො

සුපටිපන්න යනු සම්මා දිට්ඨි ආදී යහපත් ප්‍රතිපදාවට පිළිපන්නේ ය, කෙලෙසුන් නසමින් ඉදිරියට ම යන ආපසු නොඑන ප්‍රතිපදාවට පිළිපන්නේ ය, තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් ලැබෙන නිර්වාණයට පත්වීමට අනුකූල ප්‍රතිපදාවට පිළිපන්නේ ය යන අදහස යි. ස්වාක්ඛාත වූ ධර්ම විනයෙහි ඇති අනුශාසනාවට අනුකූලව පිළිපන් බැවින් ද සංඝයා සුපටිපන්න වෙති.

### උජුපටිපන්නො

ආර්ය අෂ්ටාංගික මාර්ගය නැමැති ප්‍රතිපදාව ඍජු ය. වංක නැත. "**එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා**" යනාදී වශයෙන් වදාළ පරිදි නිර්වාණය කරා යාමට ඇති එකම මාර්ගය ය. **කාමසුඛල්ලිකානුයෝග අත්තකිලමථානුයෝග** යන අන්ත දෙකට නොවැටී මධ්‍යම ප්‍රතිපදාවෙහි ගමන් කරන මාර්ගයක් වන බැවින් ද කය වචන සිත යන තුන් දොරෙහි ඇදකුද දුරු කිරීමේ ප්‍රතිපදාවක් වන බැවින් ද මේ මාර්ගය ඍජු ය. එයට පිළිපන් හෙයින් සංඝයා උජුපටිපන්න ය.

**ඤායපටිපනෙනා**

ඤාය යනු අර්ය අෂ්ඨාංගික මාර්ගය යි. සම්‍යක් ප්‍රතිපදාව යි. නිවැරදි උපාය යි. තවත් අර්ථයකින් කිවහොත් ඤාය යනු නිර්වාණය යි. එය අවබෝධ කිරීමේ මාර්ගය වන බැවින් ආර්ය මාර්ගයට ද ඤාය යැයි කියනු ලැබේ. මේ අනුව නිර්වාණ අවබෝධය සඳහා පිළිපන් බැවින් හෝ ආර්ය මාර්ගයට පිළිපන් බැවින් මහා සංඝරත්නය ඤාය පටිපන්න වෙති.

**සාමීචිපටිපනෙනා**

"සාමීචිකම්මනති - ඨපෙත්වා අභිවාදනාදීනි අඤ්ඤඤසස අනුචඡවිකසස වීජනවාතදානාදිනො ආභිසමාචාරිකසෙසතං අධිවචනං" යනුවෙන් චුල්ලවග්ග පාරිවාසික්ඛන්ධ අටුවාවේ සඳහන්වන පරිදි සාමීචිකම්ම යනු නමස්කාර වන්දනාදිය හැර පිදිය යුතු පුද්ගලයාට කළ යුතු පවන් සැලීම් උණුපැන් සිසිල් පැන් සකස්කර දීම් ආදී වතාවත් හා ඇප උපස්ථාන ආදිය යි. ගිහිගෙය හැර පැවිදි වූ මහා සංඝයාගේ ජීවිතය පහසුවන්නේ ඔවුනොවුන් අතර සිදුකරගන්නා වතාවත් ආදියෙනි. ඒවා ආචාර්ය අන්තේවාසික, උපජ්ඣාය සද්ධිවිහාරික, ආගන්තුක, ගමික ආදී වශයෙන් වත්තක්ඛන්ධකයෙහි දක්වා තිබේ. සංඝයා ඒ ආකාරයෙන් ඇප උපස්ථාන කරගනිමින් සමගියෙන් සතුටින් පහසුවෙන් පැවිදි ජීවිතය ගෙවන බැවින් සාමීචිපටිපන්න වෙති. එසේ ම ආර්ය මාර්ගය සසර දුකින් බැහැරලීමට සමත් වන හෙයින් සාමීචි නම් වෙයි. ඒ මඟට පිළිපන් බැවින් ද මහසඟරුවන සාමීචි පටිපන්න වෙති.

**ආහුනෙයොා**

ආහුන යනු මව්පිය ආදී පිදිය යුත්තන්ට දුර බැහැර සිට ගෙනවුත් පුදන පුද පඬුරු ආදිය යි. එසේම දුර බැහැර සිට හෝ ගෙනවුත් සිල්වතුන්ට පුදන සිව්පසය ද ආහුන නම් වෙයි. ඒ ආහුනය ලැබීමට සීලයෙන් ගුණයෙන් සුදුසුවන හෙයින් මහ සඟ රුවන ආහුනෙය්‍ය වෙයි.

**පාහුනෙයොා**

පාහුන යනු බැහැරින් පැමිණෙන ඥාති මිත්‍රාදීන් සඳහා පිළියෙල කරන හෝ වෙන් කර ඇති භෝජනාදිය යි. ඒවා ඔවුන්ට පවා නොදී සංඝයාට පිදීම සුදුසුවන බැවින් උන්වහන්සේ පාහුනෙය්‍ය වෙති. සාමාන්‍ය ආගන්තුකයන් ආහුනයට සුදුසු වන්නේ බැහැරින් පැමිණි නිසා හෝ නෑ හිත මිතුරන් වන නිසා මිස වෙනත් ගුණයක් නිසා නොවේ. එහෙත් එම ආහුනය හෙවත් ආගන්තුක සංග්‍රහය ඔවුන්ට පවා නොදී සංඝයාට පිදීම සුදුසු වන්නේ සංඝයා සීලාදී ගුණයෙන් උතුම් වන බැවිනි. කලාතුරකින් පහළවන පිදිය යුත්තන් වන බැවිනි.

### දක්ඛිණෙය්‍යො

දක්ෂිණාව යනු පරලොව සුව පතා දෙන දානය යි. මියපරලොව ගිය ඇත්තන්ට සැප පිණිස දෙන දානය ද හින්දු දහමට අනුව දක්ෂිණාව යැයි හඳුන්වනු ලැබේ. එහිදී සිදුවූයේ මියගියවුන්ට භුක්ති විඳීමට ප්‍රණීත ආහාරපානාදිය පිදේනි තටු ලෙස තැබීම ය. එය නිෂ්ඵල ය. ඵලවත් ක්‍රමය නම් සිල්වත්, ගුණවත්, උතුමන්ට ඒවා පුදා මියගියවුන්ට පිං අනුමෝදන් කරවීමයි. එසේ පුදන දන සංඝගත දක්ෂිණාව නම් වෙයි. එම දක්ෂිණාව ලැබීමට සුදුසු වන හෙයින් සංඝයා දක්ඛිණෙය්‍ය නම් වෙති.

### අඤ්ජලිකරණීය

අභිවාදන - හිස මුදුනෙන් වැඳීම. පච්චුට්ඨාන - හුනස්නෙන් නැඟී සිටීම. අඤ්ජලිකම්ම - දෑත් එක් තැන් කොට ආචාර සමාචාර දැක්වීම. සාමීචිකම්ම - වතාවත් කිරීම යනුවෙන් ගරු කළ යුත්තන්ට ගරු කරන පිදිය යුත්තන් පුදන ක්‍රම හතරකි. ඒ අතරින් අඤ්ජලිකර්මයට හෙවත් ලොව ඕනෑ ම කෙනෙක් තවත් කෙනෙකුට ගරු කළ යුත්තෙකැයි සලකා දක්වන ආචාර සමාචාරවලට ස්වභාවයෙන් ම සුදුසුවන හෙයින් මහසඟරුවන අඤ්ජලිකරණීය වෙති. අඤ්ජලි කම්ම යන්නේ අදහස ආචාර කිරීම වුවත් සාමීචි කර්මය හැර අභිවාදන, පච්චුට්ඨාන, අඤ්ජලිකම්ම යන තුන් ආකාරයෙන් ම වැඳුම් පිදුම් ගරු සරු කිරීම මෙහි අඤ්ජලිකරණීය යන්නෙන් අදහස් කරයි.

### අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස

කෙතක බිජුවට වැපුරූ විට කලකට පසුව ඒවා පැසී අස්වනු, පලදාව ගෙන දෙයි. එසේ ම සංඝයා කෙරෙහි ඉහත කී ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිණෙය්‍ය, අඤ්ජලිකරණීය වශයෙන් කරන ලද දාන මාන, පුද පූජා ආදී පින් දහම් සසර පුරා ඉතා ඉහළ සැප සම්පත් පල ගෙන දෙන්නේ ය. එහෙයින් සැදැහැවතුන්ට මහ සඟරුවන උතුම් පින්කෙතක් බඳු ය. සඟගුණ නවය අතරින් සුපටිපන්න, උජුපටිපන්න, ඤායපටිපන්න, සාමීචිපටිපන්න යන හතර සංඝයා භාවනාවෙන් වතින් පිළිවෙතින් වැඩිය යුතු පුරුදු පුහුණු කළයුතු ධර්ම හතරකි. උන්වහන්සේ ආර්යයන් වහන්සේ නමක් වන්නේ ද පිදිය යුත්තෙක් වන්නේ ද ඒ ගුණ ධර්ම හතර නිසා ය. ඉතිරි ගුණ පහෙන් කියවෙන්නේ සංඝයා වහන්සේ එම ගුණ හතරෙන් සපිරි නිසා ලෝකයාගේ වන්දනාමාන පුද පූජාවලට සුදුසුවන බවයි. උන්වහන්සේට කවර ආකාරයේ පිදුම් ලැබේ ද යන්නයි.

**අභ්‍යාස**

01. සුපටිපන්න පාඨය නිවැරැදි ව මතකයෙන් ලියන්න.
02. මහා සංඝරත්නය සතු නව ගුණයන් වෙන වෙන ම මතකයෙන් විස්තර කරන්න.